# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/ 42/2019 (PSC/NPC)

පී.ඒ.ප්‍රියන්ත උදය කුමාර

**අභියාචක**

**එදිරිව**

**ජාතික පොලිස් කොමිසම**

**වගඋත්තරකරු**

**දිනය :- 2025.04.29**

**පෙනී සිටීම :-** විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)

ජේ.ජේ.රත්නසිරි (සාමාජික)

එස්.නන්දසේකරන් (සාමාජික)

පාර්ශවකරුවන් :- අභියාචක වෙනුවෙන් රජයේ සේවක ඩී.ආර්.ඩී.යූ.දිසානායක මහතා

වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ නීති නිලධාරිනී ආර්.පී.ජයතුංග මෙනවිය.

**විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා**

## -<u>නියෝගය</u>-

**දකුණු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් අභියාචකට එරෙහිව, 2013.08.13 වෙනි දිනැති ලේඛනය මඟින් චෝදනා 03ක් ඇතුළත් චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇත. එකී චෝදනා සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව, ඉදිරිපත් කර ඇති ප්‍රථම සහ තුන්වන චෝදනා දෙකෙන් අභියාචක නිදහස් කර ඇති අතර, දෙවන චෝදනාවට අභියාචක වැරදිකරු බවට පත්කර ඇත. එම තීරණය මත දකුණු පළාත භාර නියෝජ්‍ය පොලිස්පති විසින්, විධිමත් විනය පරීක්ෂණයේ**

තීරණය අනුව යමින් අභියාචක 1 සහ 3 චෝදනා දෙකෙන් නිදහස් කර ඇත. ඉතිරි චෝදනාව වන්නේ දෙපාර්තමේන්තු නියෝග A7 සමඟ කියවෙන බී පරිශිෂ්ඨයේ විනය සංග්‍රහයේ 2G වගන්තියේ දැක්වෙන අණට අකීකරුව හෝ පීඩාකාරී අන්දමින් හැසිරීමයි. අණට අකීකරුවීම හෝ පීඩාකාරී ලෙස හැසිරීම මුල් කරගෙන ඉදිරිපත් කරන ලද චෝදනාවට අභියාචක වැරදිකරු කරමින්, ඒ සඳහා වන දඬුවම ලෙස එක් වැටුප් වර්ධකයක් විලම්භනය කර ඇත. ඒ සමඟම එවකට ක්‍රියාත්මක වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව කටයුතු කරමින්, රු.30,000/=ක මුදලක් අභියාචකගෙන් අයකර ගැනීමට ද තීරණය කර ඇතත්, පසුව එම චක්‍රලේඛනය සංශෝධනය කර ඇති හෙයින් එම මුදල අභියාචකගෙන් අයකරගෙන නොමැත. ඒ අනුව මෙහිදී සළකා බැලිය යුතු වන්නේ, අභියාචක වෙත ඉදිරිපත් කර තිබූ, අණට අකීකරව හෝ පීඩාකාරී ලෙස හැසිරීම යන චෝදනාවට ඔහුව වරදකරු කරමින් ගෙන ඇති තීරණයේ නිරවද්‍යතාවයයි.

ඉහත කී දෙවන චෝදනාව පදනම් කරගෙන ඇත්තේ 2013.02.01 වෙනි දින සිදුවූ සිද්ධියක් මුල් කරගෙන ය. එනම් අභියාචක යක්කලමුල්ල පොලිස් ස්ථානයේ සේවය කරමින් සිටි කාල පරිච්ඡේදය තුළ දී, 2013.02.01 දින ලොකු නාරංගොඩගේ සිරිපාල යන අය නිවසේ නොසිටි අවස්ථාවේ ඔහුගේ නිවසට ගොස් රිය අනතුරකට ඔහු සම්බන්ධ බව දන්වා, ඔහුට අයත් අංක SP-JI 4047 දරණ යතුරු පැදිය පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස්, යතුරු පැදියේ කැබ් හෝල් එකේ විෂ මත්ද්‍රව්‍යයක් වන හෙරොයින් තිබූ බවට ව්‍යාජ ලෙස හඟවමින් ක්‍රියා කර තිබීමයි.

ඉහත චෝදනාව ඔප්පු කිරීම සඳහා පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයේ දී චෝදනාවේ සඳහන් සිරිපාල යන අය සාක්ෂියට කැඳවා ඇත. ඊට අමතරව ඔහුගේ බිරිඳ සහ තවත් පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකු ද සාක්ෂියට කැඳවා ඇත.

සිරිපාල යන අය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, ඔහුගේ යතුරු පැදිය පොලිසියට රැගෙන ගිය බව ඔහු වෙත දැනුම් දුන් බවයි. ඉන් අනතුරුව සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ, ඔහුගේ බිරිඳ සහ උදය කුමාර නැමැති මෙම අභියාචක අතර අනියම් සම්බන්ධතාවයක් පවතින බැවින්, සාක්ෂිකරු අමාරුවේ දැමීමට බිරිඳ විසින් යතුරු පැදියට කුඩු දැමීමෙන් පසුව, අභියාචක විසින් යතුරු පැදිය පොලිස් ස්ථානයට රැගෙන ගොස් ඇති බවයි. එය හුදෙක්ම ඔහුගේ මනංකල්පිත තත්ත්වයකි. අභියාචක සහ ඔහුගේ

බිරිඳ අතර සම්බන්ධයක් තිබූ බවට යම්කිසි අන්දමේ සාක්ෂියක් ඉදිරිපත් වුවත්, මෙම යතුරු පැදියට හෙරොයින් යැයි කියනු ලබන මත්ද්‍රව්‍ය දමා තිබූ බව තහවුරු කිරීමට සාක්ෂියක් ඉදිරිපත් නොවේ. අනතුරුව යතුරු පැදිය යක්කලමුල්ල පොලිස් ස්ථානාධිපති විසින් ඔහුට ලබාදුන් බවට සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. යතුරු පැදිය කිසියම් අපරාධයක් සඳහා යොදා ගෙන ඇති බවට වන නඩු පැවරීමක් හෝ කර නැත. ඔහුගේ සාක්ෂියෙන් වැඩි කොටසකින් ඉදිරිපත් වන්නේ ඔහු සහ ඔහුගේ බිරිඳ අතර පැවතුනා යැයි කියන ලබන පවුල් ආරවුලක් පිළිබඳවයි.

සිරිපාල යන අයගේ බිරිඳ වන ගීතා නයනා කුමාරි යන අයද සාක්ෂි ඉදිරිපත් කර ඇත. ඇයගේ සාක්ෂියේ වැඩි කොටසකින්ම ඉදිරිපත් වන්නේ, ඇය සහ ස්වාමි පුරුෂයා අතර ඇතිවූ පවුල් ආරවුල සම්බන්ධ කරුණු පමණි. මෙම අභියාචක ඇය සමඟ කිසිම අනියම් සම්බන්ධතාවයක් පවත්වා ගෙන නොගිය බවට ඇය පැහැදිලිවම සාක්ෂි ඉදිරිපත් කර ඇත. ඇය සාක්ෂි දෙමින් ප්‍රකාශ කොට ඇත්තේ අභියාචක සහ තවත් පොලිස් නිලධාරියෙකු පැමිණ, යතුරු පැදිය ඇක්සිඩන්ට් එකකට සම්බන්ධ බව පවසා, එය රැගෙන ගිය බවයි.

මෙම යතුරු පැදිය රැගෙන ඒම සඳහා අභියාචක සමඟ රාජකාරියට ගොස් සිටි පොලිස් සැරයන් 58990 අජිත් රණසිංහ නමැති පොලිස් නිලධාරියා ද සාක්ෂි ඉදිරිපත් කර ඇත. එම සාක්ෂිකරු ද පවසා සිටියේ මෙම යතුරු පැදියේ කැබිනොල් එකේ කුඩා පාර්සලයක් තිබූ බවත්, අනතුරුව යතුරු පැදිය පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත් ය.

එවකට සිටි පොලිස් ස්ථානාධිපති සාක්ෂි දෙමින් පවසා ඇත්තේ, පොලිස් ස්ථානයට රැගෙන ආ යතුරු පැදිය සම්බන්ධයෙන් එහි හිමිකරු සහ ඔහුගේ බිරිඳ කැඳවා පරීක්ෂණයක් පැවැත්වූ බවයි. ඉන් අනතුරුව ඔහු එම යතුරු පැදිය හිමිකරුට මුදාහැරිය බවත්, මේ සම්බන්ධයෙන් නඩු කටයුත්තක් පවත්වා ගෙන නොගිය බවටත් ඔහු ප්‍රකාශ කොට ඇත. ඒ අනුව පෙනී යන්නේ මෙහිදී කිසිදු අපරාධයක් සිදුවී නොමැති බවයි. ස්ථානාධිපතිවරයා වැඩිදුරටත් පවසා සිටියේ මෙම සිද්ධිය පවුල් ආරවුලක් මත සිදුවී ඇති බවත්, අනතුරුව පාර්ශවකරුවන් අතර ඇතිවූ සමථය හේතු කොට ගෙන, මෙම සිද්ධියට අදාළ යතුරු පැදිය යොදා ගනිමින් අපරාධයක් සිදුවී තිබීම යන කරුණ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු පවත්වා ගෙන නොයාමට තීරණය කරන ලද බවයි.

මෙම තත්ත්වය යටතේ අභියාචක විසින් අණට අකීකරුව හෝ පීඩාකාරී ලෙස හැසිරෙමින් මහජනයාගෙන් කෙනෙකුට අවිනීත අන්දමින් හෝ පීඩාකාරී අන්දමින් හැසිරීම යන වරද සිදුකර තිබේද යන්න සළකා බැලිය යුතුය.

ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව පෙනී යන්නේ කිසියම් පුද්ගලයෙකු සතු යතුරු පැදියක් අභියාචක විසින් පොලිස් ස්ථානයට රැගෙන ඒම යන කරුණයි. මෙම කටයුත්ත සඳහා සහභාගී වී ඇති පොලිස් නිලධාරීන් දෙදෙනා අතරින් ජ්‍යෙෂ්ඨ නිලධාරියා වන්නේ පොලිස් සැරයන් අජිත් රණසිංහ නමැති අයයි. අභියාචක පොලිස් කොස්තාපල්වරයෙකි. එසේ නම් මෙම සිද්ධියේ වගකීම භාරගත යුත්තේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා විසිනි. ඔහු සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ගයක් ගැන කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවේ. එහෙත් එම නිලධාරියා අභියාචකට එරෙහිව පැවති විනය පරීක්ෂණයේදී සාක්ෂියට කැඳවා ඇත. මෙවැනි අවස්ථාවක දී කණිෂ්ඨ නිලධාරියකු කටයුතු කරනු ලබන්නේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ උපදෙස් හා නියෝග අනුවයි. එවැනි අවස්ථාවක දී කණිෂ්ඨ නිලධාරියා සතු වගකීමේ ප්‍රමාණය අඩුවනවා ඇත. එවැනි තත්ත්වයක් යටතේ කණිෂ්ඨ නිලධාරියෙකු වෙත වගකීම පවරන්නේ නම්, ජ්‍යෙෂ්ඨ නිලධාරියා සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරය ගැන කිසියම් හෝ සාක්ෂියක් ඉදිරිපත් වී තිබිය යුතුය. එවැනි සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති අවස්ථාවකදී කණිෂ්ඨ නිලධාරියා චෝදනාව සම්බන්ධයෙන් වරදකරු කිරීම නිවැරදි නොවේ.

තවද, අභියාචක වෙත නගා තිබූ ප්‍රධාන චෝදනා දෙකකින් ම අභියාචක නිදොස් කර නිදහස් කර ඇත. එවැනි තත්ත්වයක් යටතේ සියළු චෝදනා සම්බන්ධයෙන්ම ඉදිරිපත් වී ඇති සාක්ෂි සළකා බලා, දෙවෙනි චෝදනාව සම්බන්ධයෙන් පමණක් වරදකරු බවට පත් කරන්නේ නම්, ඒ සම්බන්ධව කිසියම් පැහැදිලි කිරීමක් කර තිබිය යුතුවේ. එවැනි පැහැදිලි කිරීමක් ද මෙහිදී දක්නට නොමැත.

ඉහත කරුණු සළකා බලා අභියාචක වරදකරු බවට පත්කර ඇති දෙවන චෝදනාවෙන් ද ඔහු වරදකරු බවට පත්කිරීම දෝෂ සහගත බව පැහැදිලිව පෙනී යයි. ඒ අනුව අභියාචකගේ අභියාචනයට ඉඩදෙමින් ඔහුට පොලිස් කොමිෂන් සභාව විසින් පනවා ඇති "**එක් වැටුප් වර්ධකයක් විලම්භනය කිරීම**" යන විනය නියෝගය ඉවත් කරමු. එකී මෙම විනිශ්චය

අධිකාරයේ තීරණය ඒ අයුරින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත වැඩිදුරටත් නියෝග කරමු

ඉහත කරුණු සළකා බලා අභියාචකගේ අභියාචනයට ඉඩදීමට තීරණය කරමු.

අභියාචනයට අවසර දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-